**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය කම්කරු දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 03 දින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2 ඡේදයේ සිට 2.14 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| -------------------------------------------------- | | ------------------------- | ------------- |
| මුදල් රෙගුලාසි<br>---------------------- | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.8 |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.1 (ආ) |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මුල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබිම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 (ආ)<br><br>2.2 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම | 2.13 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.8 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.1 (ආ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයන් 143 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 139 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් හා ඒ සඳහා එකතුව රු.මිලියන 56.025 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

(i) සමාලෝචිත වර්ෂය තුලදී රත්නපුර, බදුල්ල හා හැටන් කම්කරු කාර්යාල ඉදිකිරීම වෙනුවෙන් රු.මිලි. 65 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වනවිට සියයට 75 ක ඉදිකිරීම් නිම කිරීමට සැලසුම්කර තිබුණද ප්‍රසම්පාදන කටයුතු පමණක් සිදු කර තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් පහත සඳහන් කාර්යය සැලසුම් කළ පරිදි සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

| කාර්යය | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | සිදුකළ ප්‍රමාණය | සිදු නොකළ ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| සාමුහික ගිවිසුම් 40 ක් ගැසට් කිරීම. | 40 | 17 | 23 | 57.50 |
| නඩු පැවරීම. | 17 | 09 | 08 | 47.00 |
| වැඩ පරිසරයන් අධ්‍යානය කිරීමේ වැඩසටහන්. | 110 | 65 | 45 | 41.90 |

| | | | | |
|---|---|---|---|---|
| කම්කරු පරීක්ෂණ | 82,028 | 29,611 | 60,669 | 73.96 |
| සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගේ ඇඟිලි සලකුණු ලියාපදිංචිය. | 50,000 | .12,600 | 37,400 | 74.80 |
| නඩු පැවරීමෙන් අය කර ගැනීමට අපේක්ෂිත මුදල. | රු. 500,000 | රු. 62,501 | රු. 437,499 | 87.50 |

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**-------------------------------------------**

**(i)** කර්මාන්ත සුරක්ෂිතතා අංශය විසින් හදිසි අනතුරුවලින් තොර නිදහස් වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා ආරක්ෂාව සෞඛ්‍ය හා අනතුරු සම්බන්ධ පරීක්ෂාවන් 6400 ක් සැලසුම්කර ඉන් පරීක්ෂාවන් 1457 ක් ඉටුකර නොතිබුණු අතර කර්මාන්ත හා වෘත්තීය පුහුණු ශිෂ්‍යයන්ට පැවැත්වීමට සැලසුම් කල OSH සම්මන්ත්‍රණ 10 ක් අතුරින් 04 ක් පවත්වා නොතිබුණි.

**(ii)** කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂණ හා නඩු පරිගණකගත කිරීමට පරිගණක වැඩසටහනක් 2010 වර්ෂයේදී හඳුන්වා දී තිබුණි. 2017 වර්ෂය අවසන් වන විටත් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක නොවන අතර මෙම පද්ධතියට නඩු තොරතුරු සම්බන්ධයෙන් 2209 ක්ද, පැමිණිලි සම්බන්ධව 1045 ක්ද, කම්කරු පරීක්ෂණ සම්බන්ධව 53140 ක්වූ තොරතුරු ඇතුලත් කර යාවත්කාලීන කර නොතිබුණි. තවද, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල නිලධාරීන්ගේ චාරිකා වැඩසටහන් හා හදිසි අනතුරු වාර්තා ඇතුලත් කිරීමට ඉංජිනේරු පරීක්ෂණ මොඩියුලයක් හඳුන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ සිදුකල පරීක්ෂණ 4835 ක් අතුරින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වාර්තා 38 ක් පමණක් පද්ධතියට ඇතුලත් කර තිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**------------------------------------------------------------**

(i) වැසිකිලි පද්ධති 20 ක් ඉදිකිරීමේ රු. 49,400,308 ක් වූ කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබාදී තිබුණද ඉන් 12 ක් නිම කර ඉතිරි 08 අතහැර දමා තිබුණි. එය 2015 වර්ෂයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණි. එම වැසිකිලි පද්ධති 08 න් 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේදී රු.3,901,733 ක වටිනාකමකට කම්කරු දෙපාර්තමේන්තුවේ වහල අලුත්වැඩියාව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාරදී තිබුණ ද එම කටයුතු නිසි පරිදි ඉටු නොකර අතහැර දමා තිබුණි. රු.22,940,148 ක මුදලකට එම කාර්යය නැවත ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට එම කාර්යය සඳහා රු.12,478,690 ක් ගෙවා තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---

### 2.2.1 ප්‍රසම්පාදනය සැලැසුම් කිරීම

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ බහු මාධ්‍ය යන්ත්‍ර 01 හා රාජකාරී ගමන් මළු 150 ක් රු.1,121,500 කට මිලදීගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ සැලසුම් කල කාල රාමුව තුල භාණ්ඩ මිලදී ගෙන නොතිබූ අතර ඇස්තමේන්තුගත වියදම වූ රු.22,250,000 ක මුදලින් 2017 නොවැම්බර් 15 දින වන විට උපයෝජනය කර තිබුණේ රු. 4,374,595 කි. එහි ප්‍රතිශතය සියයට 19.7 ක් වූ අතර ප්‍රසම්පාදන මුදලින් සියයට 75.69 ක්ම අවසාන මාස 1 1/2 ක කාලය තුල උපයෝජනය කර තිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

---

(අ) සේවක අර්ථසාධක අරමුදලේ සේවාවන් වඩා කාර්යක්ෂමව සැපයීම උදෙසා මෙහෙවර පියස ගොඩනැගිල්ල ඉදිකිරීමට සැළසුම් කර තිබූ අතර රු.7,891,010,136 ක මිලකට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. කොන්ත්‍රාත් සමාගම ලබා දී ඇති ලංසු ඇපකරය (Bild Security) වූ රු.මිලියන 50 ක අගය ලංකා බැංකුව මඟින් ලබාගෙන තිබුණු අතර එය හවුල් ව්‍යාපාරය නමින් නොව එක් හවුල්කරුවෙකු වූ Sarpooji Pallonji Mid East LLC නමින් ලබාගෙන තිබුණි. ඉදිකිරීම් ඉංජිනේරු පුහුණු ආයතනයේ (ICTAD) කොන්ත්‍රාත් මාර්ගෝපදේශ සංග්‍රහයේ I කොටස C 17.3 ඡේදය ප්‍රකාරව ඉහත සුරක්ෂණය හවුල් ව්‍යාපාරය නමින් ලබාගත යුතු බවත් ඒ අනුව ලංසු ඇගයීමේදී ප්‍රතික්ෂේප වියයුතු ආයතනයකට ඉදිකිරීම් පවරා තිබුණි.

(ආ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදී තිබූ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රු. 21,001,636 ක වහල අළුත්වැඩියා කොන්ත්‍රාත් කටයුතු පැහැර හැරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 (ආ), 8.11.5(අ)(ආ) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) කම්කරු මහ ලේකම් කාර්යාලයේ ජනෙල් අළුත්වැඩියාව වෙනුවෙන් රු. 13,514,028 ක කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 වගන්තිය ප්‍රකාරව වැඩ නිම කිරීමේ සහතික ලබා ගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වතක්ම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

---

පානදුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය භාවිතා කරන මෝටර් රථය රු.313,667 ක් වැයකර අළුත්වැඩියා කරගෙන තිබුණද අළුත්වැඩියාව නිසි පරිදි සිදුකර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

වටිනාකම රු.2,500,000 ක් වූ වාහන 03 ක් 2015 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණු අතර ඒවා අනාරක්ෂිතව කාර්යාල පරිශ්‍රයේ තබා තිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන්ට දී ඇති වත්කම්**

**-------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් වටිනාකම තහවුරු නොකල වත්කම් අයිතම 14 ක් 2015 වර්ෂයේදී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ලබාදී තිබුණි.

**2.4 බැදීම් හා බැරකම්**

**------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

**------------------------------------------------------**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලනොවී පුනරාවර්තන වැය විෂයයන් 05 ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 180.9 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 15.4 කින් ඉක්මවා රු.මිලියන 21.8 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.5 විසඳා නොතිබුණු විගණන ඡේද**

**--------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.12 (ඌ) (i,ii,iii,iv) | LISA (කම්කරු පර්යේෂණ ,පැමිණිලි හා නඩු පරිගණකගත කිරීමේ වැඩසටහන) පද්ධතියට විධිමත් ලෙස දත්ත ඇතුළත් නොකිරීම හා තල (Tab) පරිගණක භාවිතය අවම මට්ටමක පැවතීම. තවද, ලබාදී තිබූ තල පරිගණක වැඩසටහන සඳහා භාවිතයට ගෙන නොතිබූ අතර ඒවා නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2016 | 3.8 (අ) (viii) | |

## 2.6 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** 1964 අගෝස්තු මස 31 දිනැති නඩු පැවරීමේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 11 හි 03 වන වගන්තිය ප්‍රකාරව උසාවි කාර්ය පටිපාටිය ගැන උසාවි යන නිලධාරීන් සතු දැනුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවරන ලද රු. 231,082 ක වටිනාකමක් සහිත නඩු නිශ්ප්‍රභා වී තිබුණි. තවද, 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනතේ හා කම්කරු විනිශ්චය සභා නියෝගයන්ට අනුව අදාල මුදල් සේවායන්ගෙන් අය කර ගැනීටම පවතින කාලපරිච්ඡේදය තුල එම මුදල් අය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා කාලාවරෝධයට ලක් වූ රු.2,558,977 ක වටිනාකමකින් යුතු නඩු ගොනු විගණන නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**(ආ)** **කර්මාන්තශාලා සුරක්ෂිතතාව**

-------------------------------

(i) කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීමට අදාල ප්‍රමිතීන් යාවත්කාලීන නොවීම, ඉදිකිරීම් කටයුතු වල නිරත සේවක සුරක්ෂිතතාවය තහවුරු නොවීම, අනතුරුවලට මුහුණදුන් සේවකයන්ට ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදීම, අවධානම් සහිත කර්මාන්තශාලා සම්බන්ධ විධිමත් පරීක්ෂාවක් සිදුකරලීම හා පනත යටතේ ලියාපදිංචි නොවූ කර්මාන්තශාලා සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු සම්බන්ධයෙන් 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනතේ නියමයන් යාවත් කාලීන කිරීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ii) පෞද්ගලික හා රජයේ ආයතන 28,854 ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වී තිබුණු අතර ඒ අතරින් කර්මාන්තශාලා ගණයට වැටෙන ආයතන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ටාර් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි ආයතනවලින් තොරතුරු ලබාගෙන එම ආයතන ලියාපදිංචි කරවා ගැනීමට උපායමාර්ගික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඇ)** වෘත්තීය සමිති ලියාපදිංචිය හා පාලනය, නියාමනය වෘත්තීය සමිති අංශය සිදු කරන අතර 2017 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි වෘත්තීය සමිති/ සම්මේලන සංඛ්‍යාව 1668 ක් විය. වාර්ෂිකව ලියාපදිංචිය අලුත්කල යුතු වුවත් වෘත්තීය සමිති 1437 ක් ලියාපදිංචිය අලුත්කර ගෙන නොතිබුණි.

**(ඈ)** මෙහෙවර පියස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 7,169 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුමකට 2011 අගෝස්තු 12 වන දින එළඹී තිබුණි. මෙම ඉදිකිරීමට අවශ්‍ය රු.මිලියන 5,147 ක මුදල සේවක අර්ථ සාධක අරමුදලෙන් ලබා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණු අතර රු.මිලියන 1,890.5 ක් ගෙවීම් කර තිබුණි. පසුව ඇතිවූ ගැටලුකාරී නීතිමය තත්වයක් හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදලින් ගෙවන ලද මුදල් භාණ්ඩාගාරයෙන් අරමුදලට ප්‍රතිපූර්ණය කිරීමට එකඟවී තිබුණ ද රු.මිලියන 377.14 ක් 2018 ඔක්තොම්බර් වන විටත් ගෙවා නොතිබුණි. මෙම තත්වයන් හේතුවෙන් ගෙවීම් ප්‍රමාදවීම නිසා රු.මිලියන 2.27 ක ප්‍රමාද ගාස්තු ගෙවීමට දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණි.

**(ඉ)** සියලුම කම්කරු කාර්යාලය විසින් ඉටු කරන ලද කාර්යභාරයන් පිළිබඳ දත්ත රැස්කිරීම හා එම දත්ත පරිගණක ගත කිරීමේ වැඩසටහනක් 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණද අදාල

දත්ත නිවැරදිව ඇතුලත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විටත් එම වැඩසටහන අසාර්ථකව පැවතුණි.

**(ඊ)** 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය නංවාලීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ඉදිරිපත් කල තාක්ෂණ ලියවිල්ලේ ඇතුලත් වාරක පරීක්ෂණ සම්බන්ධව වූ ප්‍රතිපත්තියක් ගොඩනැගීම පිළිබඳ නිර්දේශය 2017 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

(උ) 2015 වර්ෂයේ දී රු. 679,300 කට මිලදීගත් යන්ත්‍රයක් අක්‍රිය වී තිබූ අතර වගකීම් කාලය ඉක්මවා නොතිබුණද එය මිලදී ගත් ආයතනය ලවා අලුත්වැඩියාවන් සිදුකර නොගෙන නව යන්ත්‍රයක් රු. 219,000 කට මිලදී ගෙන තිබුණි.

(ඌ) කාර්යාල පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව හා මිල ගණන් කැඳවීමේදී අදාල පිරිවිතරයන් දක්වා නොතිබීම හේතුවෙන් කාර්යාලයකට අවශ්‍ය පහසුකම් නොමැති ගොඩනැගිල්ලක් රු. 1,880,000 ක වාර්ෂික කුලියකට ලබා ගෙන තිබුණි.

(එ) පානදුර කම්කරු කාර්යාලයේ සමාලෝචිත වර්ෂය තුලදී රු.7,329,818 ක් වූ නඩු 99 ක් විවෘත වරෙන්තු ලෙස පැවතුණු අතර කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව එම විවෘත වරෙන්තු ක්‍රියාත්මක කිරීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීමට පවරන ලද රු.17,811,209 ක් වූ නඩු 184 ක් සමාලෝචිත වර්ෂය තුලදී අක්‍රීයව පැවතිණි. එම අක්‍රීය හා විවෘත වරෙන්තු ලෙස පවතින නඩු සක්‍රීය කිරීමට හෝ විවෘත වරෙන්තු ක්‍රියාත්මක කිරීමේ කාල ප්‍රමාදය වසර 05 සිට වසර 23 දක්වා විය.

(ඒ) දින 14 ක් තුල සේවක අර්ථ සාධක අරමුදලට ලැබිය යුතු දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග නොගත් රු.12,072,646ක් වූ අවස්ථා 11 ක් පානදුර කම්කරු බල ප්‍රදේශය තුල පැවතිණි. එම කාල ප්‍රමාදය දින 50 සිට දින 373 දක්වා විය.

(ඔ) කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි දිගු කලකින් පරික්ෂාවට භාජනය නොවූ ආයතන පරික්ෂාවන් සඳහා තෝරා ගතයුතු බවට උපදෙස් දී තිබුණ ද පානදුර කම්කරු බල ප්‍රදේශය තුල 2017 වර්ෂය අවසානයේ දී හඳුනාගත් ආයතන 9681ක් වූ අතර ඒ අතරින් කම්කරු නිලධාරීන් විසින් පරික්ෂාවට භාජනය කළ ආයතන ප්‍රමාණය 1,067 කි. සමස්ථයක් ලෙස ගත්කළ මෙම කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් ආයතන ප්‍රමාණයෙන් සියයට 89 ක් පරික්ෂාවට ලක් වී නොතිබුණි.

(ඕ) එක් කම්කරු නිලධාරියෙකු විසින් මාසිකව කාලීන පරීක්ෂණ 20 ක් අවම වශයෙන් සිදු කල යුතු බවට දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගින් පෙන්වා දී තිබුණද යාපනය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකු සහ වවුනියාව, කිලිනොච්චිය, මුලතිව් සහ මන්නාරම යන කාර්යාලයන්හි එක් නිලධාරියෙකු බැගින් මෙලෙස කටයුතු කර නොතිබුණි.

**2.7 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

**-----------------------------------**

**(අ)** දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට අයවිය යුතු රු. 3,047,487 ක් වූ නඩු ගොනු 17 ක් අස්ථාන ගත වී තිබුණු අතර එයට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග 2017 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව පවරන ලද රු.1,844,462,320 ක් වූ අක්‍රීය නඩු 3,750 ක් ද රු.916,693,284 ක් වූ විවෘත්ත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,563 ක් වූ අතර ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, මහජන පෙත්සම් හා පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| කාර්යය | මුළු ප්‍රමාණය | ඉටු කළ ප්‍රමාණය | ඉටු නොකළ ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| සේවක අයදුම්පත්‍ර නිරවුල් කිරීම. | 174 | 80 | 94 | 54 |
| කර්මාන්තශාලා ලියාපදිංචිය. | 28,382, | 2,923 | 25,459 | 89.7 |
| කාර්මික ආරවුල් විසඳීම | 547 | 108 | 439 | 80.3 |
| කාර්මික අධිකරණයේ කාර්මික ආරවුල් හා අනිවාර්ය බේරුම්කරණයට යොමු වූ ආරවුල්. | 225 | 54 | 171 | 33.8 |
| විශේෂ විමර්ශන අංශයට යොමු වූ පැමිණිලි | 1,229 | 472 | 757 | 61.6 |
| මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලද පැමිණිලි. | 332 | 52 | 280 | 84.3 |
| නියෝග මඟින් නියම කළ වන්දි මුදල් අයකර ගැනීම (සේවය අවසන් කිරීමේ අංශය) | රු.147,270,639 | රු.181,496 | රු.147,089,143 | 99.9 |

**2.8 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1,100.6 | 1,016.1 | 84.5 | 7.7 |
| | මූලධන | 760.2 | 732.9 | 27.3 | 3.6 |
| | **එකතුව** | **1,860.9** | **1,749** | **111.8** | **6** |
| 2014 | පුනරාවර්තන | 1,138.5 | 1,117.1 | 21.4 | 1.9 |
| | මූලධන | 373.2 | 306.8 | 66.3 | 17.8 |
| | **එකතුව** | **1,511.7** | **1,424** | **87.8** | **5.8** |
| 2015 | පුනරාවර්තන | 1,411.2 | 1,357.9 | 53.3 | 3.8 |
| | මූලධන | 1,706 | 1,574.2 | 131.7 | 7.7 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **එකතුව** | **3,117.1** | **2,932.1** | **185** | **5.9** |
| 2016 | පුනරාවර්තන | 1,489.9 | 1,453.2 | 36.7 | 2.5 |
| | මූලධන | 5,060.7 | 3,472 | 1,588.7 | 31.4 |
| | **එකතුව** | **6,550.6** | **4,925.1** | **1,625.4** | **24.8** |
| 2017 | පුනරාවර්තන | 1,505.2 | 1,452.6 | 52.7 | 3.5 |
| | මූලධන | 3,607.3 | 2,450.8 | 1,156.5 | 32.1 |
| | **එකතුව** | **5,112.6** | **3,903.3** | **1,209.2** | **23.7** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

මූලධන වැය විෂයක් සඳහා සළසා තිබුණු රු. මිලි 01 ක මුලු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුලුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයන් 15 ක් සඳහා එකතුව රු. මිලියන 16.2 ක් ප්‍රතිපාදන සලසා තිබූ අතර එම වැය විෂයන්ට අදාල ප්‍රතිපාදන වලින් එකතුව රු.මිලියන 11.15 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 87 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 75.00 | 71.90 | 60.00 | 69.20 | 265.00 | 237.60 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,673,116 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 38 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**(ආ) මියගිය හා විශ්‍රාම ගිය හා සේවය හැරගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීම**

2017 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමගිය, මියගිය හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 1,347,936 ක් වර්ෂ 02 සිට 27 දක්වා කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද ණය ලිපිගොනු 05 ක් අස්ථානගතවී තිබුණි.

## 2.10 අග්‍රිම ගිණුම

මුදල් රෙගුලාසි 371(2)(ආ) රෙගුලාසියට පටහැනිව අවස්ථා 04 කදී නිලධාරීන් 04 ක් වෙත රු.100,000 ක් ඉක්මවූ එකතුව රු. 856,751 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

## 2.11 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 1,005 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. මිලියන 223.19 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පොදු තැන්පතු ශේෂය තුල අඩංගු නොවන රු.12,936,819 ක ශේෂයක් හඳුනාගත් අතර එය 2009 වර්ෂයට පෙර පැවති ගිණුම් අංකයක් වූ 6000-0-0-3-035 යටතේ පවතින ශේෂයක් විය.

(ඇ) අධිකරණ ක්‍රියාමාර්ග මත සේවක අර්ථසාධක අරමුදලට හා සේවාදායකයන්ට හිමි අනෙකුත් දීමනා වෙනුවෙන් කම්කරු කොමසාරිස් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2009 සිට 2017 දක්වා අයකර ගන්නා ලද රු. මිලියන 14.77 ක් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.12 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කම්කරු දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්‍ෂණය |
| --- | --- | --- |
| වැය ලෙජරය (සංඛ්‍යා ලේඛන අංශය) | මු.රෙ 449(2) | පවත්වා නොතිබුණි. |
| බැරකම් ලේඛනය | මු.රෙ 211 | විසර්ජන ගිණුමේ වැය විෂයන් 03 කට අදාල බැරකම් කිසිවක් ලේඛනයේ දක්වා නොතිබුණි. |

**2.13 අනුකූල නොවීම්**

**2.13.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| **(අ) දෙපාර්තමේන්තු චක්‍රලේඛ** | | |
| (i) 1964 අගෝස්තු මස 31 දිනැති අංක 11 දරන නඩු පැවරිමේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ 11 හි 14 වන වගන්තිය | 1,081,329 | සෑම විටකම කම්කරු නිලධාරියා විසින් තම ප්‍රථම පරික්ෂාවේදීම නඩු පැවරීම සඳහා අවශ්‍ය සෑම සාක්ෂියක්ම රැස් කල යුතු බව සහ තමාට විරුද්ධව නඩුවක් පැවරීමට යන බව දැනගත් විට යම් සේවකයෙකුට සාක්ෂි විනාශ කිරිම හෝ යටපත් කිරීමට ඉඩනොදී සාක්ෂි රැස් කල යුතු වුවත් එලෙස සිදු කර නොතිබීම. |
| (ii) දෙපාර්තමේන්තු චක්‍රලේඛ 10/2004 ප්‍රකාරව | | කම්කරු නිලධාරීන් විසින් සිදුකරන පරීක්ෂණවල පරීක්ෂණ වාර්තා දින 07 ක් ඇතුළත කාර්යාලයට භාරදිය යුතුය. පරීක්ෂණ දිනයෙන් දින 12 ක් ඉක්මවීමට පෙර සේව්‍යයා වෙත සුදුසු උපදෙස් යැවීම කළ යුතුය. උපදෙස් යැවීමෙන් පසුව පසුවිපරම් කර නැවත මාස 06 කින් පරීක්ෂණ සඳහා යොමු කල යුතුවේ. කෙසේ වෙතත් පරීක්ෂා කරන ලද ආයතනවල නැවත පසුවිපරමක් දිර්ඝ කාලයකින් සිදුකර නොතිබුණු අවස්ථා 8 ක් පැවතීම හා එහි කාල ප්‍රමාදය වසර 1 – 4 අතර විම |

**2.14** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**------------------------------------------------------------------------------------------**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 1,135.6 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 210 | 154 | 56 |
| (ii) | තෘතියික මට්ටම | 668 | 526 | 142 |
| (iii) | ද්විතියික මට්ටම | 1,771 | 1,355 | 416 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 489 | 460 | 29 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 11 | - |
| | එකතුව | 3,138 | 2,506 | 643 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **දීර්ඝ කාලීනව සේවයේ නියුතු නිලධාරීන්**

**-----------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තු සේවයේ නියුතු පරිපාලන සේවයේ නිලධාරීන් දීර්ඝ කාලීනව සේවයේ යොදවා ගත් අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු කාලය |
|---|---|---|
| පරිපාලන සේවය | 15 | වර්ෂ 5 සිට 19 දක්වා |
| කළමනාකරණ සහකාර සේවය | 279 | වර්ෂ 6 සිට 38 දක්වා |
| ප්‍රාදේශීය කාර්යාල සේවකයන් | 24 | වර්ෂ 3 සිට 15 දක්වා |

**(ආ)** **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**--------------------------------**

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව 2,495 ක් විය. සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන් 1,117 දෙනෙකුට කිසිදු පුහුණුවක් ලබාදී නොතිබුණු අතර නිලධාරීන් 70 දෙනෙකුට පැය 8 කට වඩා අඩුවෙන් පුහුණුව ලබාදී තිබුණි.